# යුද්ධයේ ජය දෙමළ ජනයාට විමුක්තියක් විය හැකි ද? (2 වන කොටස) - ගාමිණී වියන්ගොඩ (රාවය)

ලංකාවේ ජාතික ප්‍රශ්නය පිළිබඳ මුඛ්‍ය කාරණා දෙකක් සිංහල දකුණ ලවා පිළිගන්වා ගැනීමට සහ සිංහල දකුණ ලවා අවබෝධ කැරවීමට උතුරේ දේශපාලකයන් ගත් ප්‍රයත්නයේ ස්වභාවය ගැන ගිය සතියේ සාකච්ඡා කෙරුණි. ඔවුන්ගේ එම වෑයම මුල දී අවිංසාවාදී වූ බවත්, ඒ අවිහිංසාවාදී ක්‍රියාමාර්ගය අසාර්ථක වූ විට පමණක් දෙ වනු ව එය ප්‍රචණ්ඩකාරී වූ බවත් එහි දී පැහැදිලි කෙළෙමි.

මීට සති කිහිපයකට පෙර වික්ටර් අයිවන් විසින් රාවයට ලියා තිබූ ලිපියකත්, ඊට අමතරව වෙනත් ලිපි ගණනාවක් හරහාත් මෑතක සිට ඔහු ලංකාවේ යුද්ධය කෙරෙහි දක්වන නව ආකල්පය ගැන විවෘත සංවාදයක් 'ප්‍රයත්න ව්‍යාපාරය' විසින් කැඳවා තිබුණි. 'නව' සහ 'මෑතක සිට' යන විශේෂණ යෙදුවේ, යුද්ධය පිළිබඳ මේ ආකල්පය ඊට පෙර ඔහු දැරූ මතවාදයට වඩා සාරාර්ථයෙන් වෙනස් බැවිනි. වික්ටර් අයිවන් හැරුණු කොට මේ සාකච්ඡාවට කුමාර් රූපසිංහ, ටෙරන්ස් පුරසිංහ, කුමාර් ඩේවිඩ්, ජනදාස පීරිස්, ජෝ සෙනෙවිරත්න සහ ධර්මසිරි බණ්ඩාරනායක ඇතුළු පිරිසක් සහභාගි වූ හ. මේ ලිපිය ලිවීමට නිමිති වුණේ ඒ සාකච්ඡාවේ දී මතු වූ ඇතැම් කාරණා ය. වික්ටර් අයිවන් ගේ මතය වන්නේ, කිසි යම් ජන කණ්ඩායමක (ජාතියක හෝ පංතියක) අයිතීන් දිනා ගැනීමට 'ශිෂ්ට ක්‍රම' භාවිත කළ යුතු ය යන්න යි. එහි දී, 'ආයුධ දැරීමේ අයිතිය ඇත්තේ ආණ්ඩුවකට පමණක් ය' යන්න ඔහුගේ විශ්වාසය යි. ඒ හරහා ඔහුගේ අවසාන නිගමනය වන්නේ, මේ යුද්ධය ආණ්ඩුව විසින් ජයග්‍රහණය කරනු ලැබීම දෙමළ ජනතාව ගේ විමුක්තියට පාදක වන බව යි.

පරිකල්පනීය තලයක ගොඩනගන සදාචාරමය පරමාදර්ශයක් වශයෙන් පළමු කාරණය ඉතා යහපත් ය. එය එ සේ නො විය යුතුයැ'යි තර්ක කිරීම උගහට ය. දෙ වැන්න වනාහී, උත්කෘෂ්ට ප්‍රජාතන්ත්‍රවාදයක අවිවාදිත කොන්දේසියකි. තෙ වැන්න, ඓතිහාසික සාධක හරහා පමණක් ම පිළිගත යුතු හෝ බැහැර කළ යුතු අනුමිතියකි.

එහෙත් ඉතිහාසය ලියැවී ඇත්තේ මේ උත්කෘෂ්ට පරමාදර්ශ මත ම නො වේ. පළමුවැන්න සහ දෙ වැන්න එක විට අවලංගු කරමින් ලෝක ඉතිහාසය වෙනස් කළ දුසිම් ගණනක් අවස්ථා අතරින් දෙකක් පමණක් ඉදිරිපත් කරමි. එකක්, ජෝර්ජ් වොෂින්ටන් විසින් ඇමරිකා එක්සත් ජනපදය පිහිටුවීම යි. ඔහුගේ ක්‍රමය 'අශිෂ්ට' විය. ඇමරිකානු, ප්‍රංශ, ඕලන්ද සහ ස්පාඤ්ඤ ජාතිකයන් විසි දහසකට අධික ජීවිත ප්‍රමාණයක් ඔහු ඒ වෙනුවෙන් බිළි දුන්නේ ය. එ සේ කෙළේ, 'අවි දැරීමේ එකම අයිතිය තිබූ' බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට එරෙහි ව 'අශිෂ්ට' ක්‍රමයකට ය. ඉන් බිහි කෙරුණු ඇමරිකා එක්සත් ජනපදය අද ලෝකයේ 'ශිෂ්ට සම්පන්න' ම රට යැයි

කියැවේ.

දෙ වැන්න, ජාතික රාජ්‍යය නැමැති සංකල්පය මුල් වරට ලෝකයාට ප්‍රදානය කළ ප්‍රංශය යි. 1789 දී ප්‍රංශ රජුට එරෙහි ව එ රට පීඩිතයන් ගෙන ගියේ, ප්‍රංශ විප්ලවය නමින් හැඳින්වුණු 'අශිෂ්ට' වැඩ පිළිවෙලකි. ඉන් පසු එළැඹුණු 'භීම සමය' ඉතා කෲර ය. අමානුෂික ය. ඒ මගින් බිහි වූ ප්‍රංශ ජනරජය 'ශිෂ්ට සම්පන්න' රටකැ යි අද කියැවේ.

මෙයින් පෙනී යන්නේ, දේශපාලනික භාවිතාවක් 'ශිෂ්ට සම්පන්න' වීමට නම්, එම භාවිතාව විසින් ජනිත කෙරෙන නව ප්‍රවර්ධනයක් තිබිය යුතු බව යි. මෙය පසු-භාවිතාවක් වශයෙන් අත්දකින ජයග්‍රහණයකි. 'භාවිතාවේ තත්කාලීන මොහොත තුළ' පිළිගත් අර්ථයෙන් එය හැම විට ම, 'අශිෂ්ට' වන්නේ ය. මේ අවස්ථා දෙකේ දී ජයග්‍රහණය කෙරුණේ මහජන බලයකි. යුක්ති ධර්මයකි. එ බැවින් අද පවා ඒ අවස්ථා දෙක ගෞරවයෙන් සිහිපත් කෙරේ.

එහෙත් මහජන බලයක් ලද පමණින් රාජ්‍ය බලයක් සුජාත වන්නේ ද නැත. ඇඩොල්ෆ් හිට්ලර් බලයට පත් වුණේ මහජන ඡන්දයෙනි. ඒ 'සුජාතභාවයෙන්' ඔද වැඩුණු ඔහු යුද්ධයට සම්බන්ධ නො වූ හැට ලක්ෂයක් යුදෙව් සිවිල් වැසියන් ගෑස් කාමරවල දමා මරා දැම්මේ ය. රුවන්ඩාවේ 'නීත්‍යානුකූල' රජය හෙවත් 'අවි දැරීමේ එක ම අයිතිය තිබූ ආයතනය' දින සියයක් ඇතුළත තමන්ගේ රටේ ලක්ෂ අටක් ජනතාව කැති, පොරෝ, මුගුරුවලින් පෙති ගසා මරා දැම්මේ ය.

මහජන මතය පෙරළා දමමින්, 'අවි දැරීමේ එක ම අයිතිය' අභ්‍යාස කළ අවස්ථා ද එමට ය. චිලි රටේ මහජන රජය පෙරලා දැමූ පිනෝචේ, 1973 සිට දහහත් අවුරුද්දක් 'ආයුධ දැරීමේ එක ම බලය' වශයෙන් වැජඹුණි. බලයෙන් වීසි වීමෙන් පසු ව පවා, 2006 දී මිය යන තුරුත් එම රටේ කිසි නීතියකින් වත්, අන්තර්ජාතික නීතියකින් වත් ඒ අශිෂ්ටත්වය වෙනුවෙන් ඔහු දඬුවමකට භාජනය වුණේ නැත.

මේ සියල්ලෙන් පැහැදිලි වන්නේ, බලය තුළ පුරුෂාර්ථ සෙවීම නිරර්ථක බව යි. මිනිස් ගනුදෙනුවක විනිමය සාධකය බවට බලය පත් වූ පසු එය කවදත් 'අශිෂ්ට' වන බව යි. මේ නිසා යම් ජනතාවක ගේ අයිතිවාසිකම් දිනා ගැනීමේ මාදිලිය 'ශිෂ්ට සම්පන්න' විය යුතු යැයි කීම ඉතිහාස විරෝධී බව පෙනී යා යුතු ය. ශිෂ්ට ද අශිෂ්ට ද යන්න තීරණය කෙරෙන්නේ යොදා ගන්නා මාදිලියේ ස්වභාවයට වඩා, ඉල්ලා සිටින අයිතියේ වාස්තවික අගයත්, යුක්ති ධර්මයේ ආකර්ශනයත්, එය විසින් අදාළ සමාජය කෙරෙහි ඇති කෙරෙන පසු-භාවිතයේ ස්වභාවයත් විසිනි. මේ කාරණය, රාජ්‍ය බලය දරන පාර්ශ්වයට මෙන් ම එම බලය අභියෝග කරන පාර්ශ්වයටත් වලංගු ය. දෙගොල්ලන් ම එක විට හෝ වෙන් වෙන් ව, 'ශිෂ්ට' ද, 'අශිෂ්ට' ද විය හැක. මේ නිසා 'ආයුධ දැරීමේ එක ම බලය ඇත්තේ ආණ්ඩුවකට ය' යන්න ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයක් මිස පරම සත්‍යයක් නො වන බව අප තේරුම් ගත යුතු ය. (ජෝර්ජියාව මේ සම්බන්ධයෙන් අලුත් ම උදාහරණය සපයයි).

ඒ අනුව සංවාදයක් සඳහා ඉතිරි වන්නේ වික්ටර් අයිවන් ගේ අවසාන නිරීක්ෂණය වන, ආණ්ඩුවේ හමුදා විසින් යුද්ධය ජයග්‍රහණය කරනු ලැබීමෙන් පසු දෙමළ ජනයාට විමුක්තියක් අත් වේ ය යන්න පමණි.

ඕනෑ ම යුද්ධයක ජයග්‍රාහකයා විසින් පරාජිතයා නො සලකා හැරීමේ ඉඩකඩ වැඩි බව අමුතුවෙන් කිව යුතු නැත. යුද්ධයක් නො තිබුණු අවස්ථාවක දී පීඩිතයාට නො දුන් දෙයක්, රණකාමී යුද්ධයක විජයග්‍රහණයකින් පසු පරාජිත පීඩිතයා වෙත ජයග්‍රාහකයා විසින් ප්‍රදානය කෙරුණු අවස්ථා ලෝක ඉතිහාසයේ සොයා ගන්නට නැත.

වෙන ම රාජ්‍යයකින් මෙහා කිසිවකින් සෑහීමකට පත් නො වන කොටි අභිලාසය විසින් යුද්ධය මිස වෙන කිසි විකල්පයක් දකුණට ඉතිරි කොට නැතැ'යි වික්ටර් අයිවන් කියන විට, ඔහු නො කියන දෙය වන්නේ, යුද්ධය හැරුණු කොට හැම විකල්පයක් ම දෙමළ ජනතා අභිලාසය විසින් හැට වසරක් තිස්සේ ම දකුණට ඉතිරි කොට තිබුණු බව යි. ගාන්ධි වැනි මහා පුරුෂයෙකු හෝ නේරු වැනි දූවැන්ත දේශපාලනඥයෙකු පවා ජාතිය සම්බන්ධ කාරණයේ දී විශ්වාස කිරීමට මොහොමඩ් අලි ජින්නා කැමති වුණේ නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දියාව නිදහසේ දී ම දෙකඩ වී පාකිස්ථානය බිහි විය.

එහෙත් එ දා ලංකාවේ දෙමළ නායකයන් කිසිවෙකු ජින්නා කෙනෙකු වීමට බැලුවේ නැත. මෙය නිදහසටත් පෙර සිට ම සිංහලයන් ලැබූ වරප්‍රසාදිත තත්ත්වයකි. ඒ වරප්‍රසාදය අප භුක්ති වින්දේ හෙටක් ගැන නො සිතමිනි. එහි ප්‍රතිඵලය, ප්‍රභාකරන් කෙනෙකු බිහි වීම යි.

වික්ටර් අයිවන්ට අනුව වර්තමාන යුද්ධය යනු ප්‍රභාකරන්ට දෙන බෙහෙතකි. මගේ වැටහීම වන්නේ, මේ යුද්ධය, ප්‍රභාකරන්ට බෙහෙතක් වශයෙන් නො ව, දෙමළ ජාතික අභිලාසයට ගිල්ලවන බෙහෙතක් වශයෙන් සාර්ථක වනු ඇති බවට දකුණේ අධිපති චින්තනය අපේක්ෂා කරන බව යි. අවාසනාවකට මේ අසාර්ථක ප්‍රතිකාර විධිය විසින් අවසානයේ දී උතුර පමණක් නො ව දකුණත් රෝගී තත්ත්වයට පත් කරනු ඇතැ'යි මම සිතමි.